සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 14 S I,II

නම: ..............................................

# කතෝලික ධර්මය I

කාලය පැයයි එකයි

01. දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය ලෙස සළකනුයේ
    I. පංච පුස්තකය. II. ශුද්ධ බයිබලය. III. ඉතිහාස පොත්. IV. නව ගිවිසුම.

02. "ස්වාමීන් වහන්සේගේ වචනය සදහටම පවතී. මේ වචනය නම් ඔබට දේශනා කරන ලද සුබ අස්නය" මෙසේ සඳහන් වන්නේ,
    I. II පේදුරු ලිපියේ ය. II. I පේදුරු ලිපියේ ය. III. I ජොහාන් ලිපියේ ය. IV. II ජොහාන් ලිපියේ ය.

03. සුදු, කළු, 4 , 7 යන සංකේත වල අදහස් නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,
    I. ජයග්‍රහණය, සාගතය, විශ්වය, පූර්ණත්වය. II. යුද්ධය, පරිපූර්ණත්වය, මරණය, පූර්ණත්වය.
    III. ජයග්‍රහණය, විශ්වය, සාගතය, දේව ජනතාව. IV. දේව ජනතාව, විශ්වය, සාගතය, ජයග්‍රහණය.

04. මා නුඹට දිය යුතු දෙය ඉල්ලන්න. යනුවෙන් දෙවියන් වහන්සේ සළමොන් රජුට කී බව සඳහන් ග්‍රන්ථය
    I. I රාජාවලියයි. II. II රාජාවලියයි. III. II සාමුවෙල් ය. IV. I සාමුවෙල් ය.

05. සන්තියාගෝ මුනිවරයා යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන්නේ
    I. ශු. පේදුරු තුමා. II. ශු. ජොහාන් තුමා. III. ශු. මහා ජාකොබ් තුමා. IV. ශ. ජුසේ තුමා.

06. සාවුල් නායක පූජකයන්ගෙන් අවසර පතක් ලබා ගෙන කිතුණුවන් අත්අඩංගුවට ගැනීමට ගියේ,
    I. දමස්කස් නගරයට යි. II.පිලිප්පි කයිසාරියට යි. III. එම්මාවුස් නගරයට යි. IV. ජුදා සිනගෝගයට යි.

07. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

| | | | |
|---|---|---|---|
| A | හිරු අඳුරු වීම | B | අධික වර්ෂාව ඇතිවීම |
| C | රට පුරා අන්ධකාරය පහළ වීම | D | කුණාටුව සහිත සුළඟ |
| E | දේව මාළිගාවේ තිරය දෙකඩ වීම | F | භූමිකම්පාවක් ඇති වීම |

මේවා අතරින් ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ පරිසරයේ සිදු වූ වෙනස්කම් ඇතුළත් වරණය කුමක්ද?
    I. A,E,F II. A,B,C III. A,C,E IV. D,E,F

08. ශුද්ධ වූ සභාවේ ශුද්ධත්වය වර්ධනය කිරීම සඳහා ගත හැකි වඩාත් සුදුසුම ක්‍රියාමාර්ගය වන්නේ,
    I. දේව වචනය අන් අයට කියා දීම.
    II. අපගේ පව් වලට මනස්ථාපනය වී සමාව ලබා ගැනීම.
    III. සභාවේ එකමුතුකම වෙනුවෙන් යාච්ඤා කිරීම.
    IV. මීසම් සංසයේ සියලු දෙනා සාමූහිකව කටයුතු කිරීම.

09. සමදර්ශක සුබාරංචි වල සඳහන් මහ බ්‍රහස්පතින්දා දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කිරීම වෙනුවට ජොහාන් සුබාරංචියේ ඉදිරිපත් කරන්නේ,
    I. ජේසුස් වහන්සේ දුක් විඳීම හා මරණය යි. III. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීම යි.
    III. ජේසුස් වහන්සේ පූජකවරය ස්ථාපිත කිරීම යි. IV. ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාව යි.

10. ජීවනදායක භෝජනය පිළිබඳ සඳහන් වන ග්‍රන්ථය වනුයේ
    I. මතෙව් සුබාරංචිය. II. ජොහාන් සුබාරංචිය.
    III. අපෝස්තුවරුන් ගේ ක්‍රියා පොත. IV. ලූක් සුබාරංචිය.

11. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගි වීමට නම් පළමුව කළ යුතු වන්නේ
    I. අන් අයගේ පාද දෝවනය කිරීම යි. II. අන්‍යයන්ට දයාව දැක්වීම ය.
    IIII. ප්‍රේමයේ පණිත තුළ ජීවත් වීම ය. IV. සමගියෙන් කටයුතු කිරීම ය.

12. මරණීය පාපයක සිටින විට දිව්‍ය සත්ප්‍රසාදය වහන්සේ ලැබීමට පෙර කළ යුතු වන්නේ,
   I. මර්දන ක්‍රියා කිරීම ය.   II. පාපොච්චාරණය කිරීම ය.
   III. පුණ්‍ය ක්‍රියාවල යෙදීම.   IV. භාවනාවේ යෙදීම ය.

13. කතෝලික සභා ධර්මෝපදේශයේ සඳහන් පරිදි දේව වන්දනාවේ සහ ස්තුතියේ සළකුණක් ලෙස සැලකිය හැක්කේ කුමක්ද?
   I. බාරහාර පුද කිරීම.   II. මල් මාලා දැමීම.   III. ඉටි පහන් දැල්වීම.   IV. යාග ඔප්පු කිරීම.

14. පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
   A මූලධර්මවාදීන් පසු පස යාම.
   B දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගි නොවීම.
   C දෙවි කෙනෙක් නැතැයි සිතා කටයුතු කිරීම.
   D අන් අයට සාප කිරීම.
   ඉහත කරුණු අතරින් පළමු පණතට විරුද්ධ පාපයන් වන්නේ,
   I. A හා D ය.   II. B හා D ය.   III. A හා C ය.   IV. B හා C ය.

15. ජේසුස් වහන්සේ පස්වැනි පණතට දුන් නව අර්ථකථනයට අනුව අධිකරණට යටත් වන්නේ,
   I. තම සහෝදරයාට මෝඩයා කියා ගරහන්නා ය   II. තම සහෝදරයාට ජඩයා කියා ගරහන්නා ය
   III. තම සහෝදරයාට විරුද්ධව වැඩ කරන තැනැත්තා ය   IV. තම සහෝදරයා සමඟ කෝප වන තැනැත්තා ය

16. අයහපත තුළින් යහපත උදාකරන දෙවියන් වහන්සේ .. ........ .ගේ විපත මහා ජයග්‍රහණයකට හැර වූ සේක. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
   I. මෝසස්ගේ.   II. ජාකොබ්ගේ.   III. ජෝශප්ගේ.   IV. අනනියස් ගේ.

17. ජන වන්දනාව පිළිබඳ ඇති උතුම් xii වන පියුස් ශුද්ධෝත්තම පිය තුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද විශ්ව ලේඛනය නම්,
   I. බලාපොරොත්තුවේ එළිපත්ත.   II. දෙවියන් වහන්සේගේ විමුක්තිදායකයාණෝ.
   III. දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ.   IV. දේව සංරක්ෂණය.

18. මරියකුමියගේ ජම්මදෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳ ගැනීමේ මංගල්‍ය සමරනු ලබන්නේ
   I. දෙසැම්බර් 8 ය.   II. අගෝස්තු 15 ය.   III. ජනවාරි 1 ය.   IV. සැප්තැම්බර් 8 ය.

19. දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව ලෙස සළකනු ලබන්නේ
   I. ආරම්භක යැදුම යි.   II. පඬුරු මත යැදුම ය.
   III. ස්තෝත්‍ර යාගික යැදුම ය.   IV. බොදුනෙන් පසු යැදුම ය.

20. මල් උයනේ යැදුම තුළින් අපට ලබාදෙන ප්‍රබලතම පණිවිඩය වන්නේ
   I. ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවකටම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බවයි.
   II. යාච්ඤා කිරීම අපහසු වුවත් එහි නොකඩවා යෙදිය යුතු බවයි.
   III. ජීවිතයේ අසීරු අවස්ථාවන් වලදී මිතුරන් පවා අප අත් හරින බවයි.
   IV. ජීවිත අභියෝග හමුවේ නොසැළී ඒවාට මුහුණ දිය යුතු බවයි.

21. කායින් හා ආබෙල් කතාව ඇතුළත් දේව ධාර්මික සම්ප්‍රදාය වන්නේ
   I. පූජක සම්ප්‍රදාය යි.   II. එළොහිම් සම්ප්‍රදාය යි.
   IV. ද්විතීය නීති සම්ප්‍රදාය යි.   IV. යාවේ සම්ප්‍රදාය යි.

22. ද්විතීය සම්මත ග්‍රන්ථ නාමාවලියේ මුලින් සඳහන් වන ග්‍රන්ථ යුගලය ඇතුළත් වරණය තෝරන්න
   A බාරුක්   B තෝබිත්   C ජුදිත්   D සිරාක්
   I. A හා B   II. B හා C   III. A හා C   IV. B හා D

23. දිවැසිවර මීකායා
   I. ප්‍රධාන දිවැසිවරයෙකි.   II. සුළු දිවැසිවරයෙකි.
   III. ලේඛක දිවැසිවරයෙකි.   IV. දේශක දිවැසිවරයෙකි.

24. සෙරාප්වරුන් ගේ හඬින් දේව මාළිගාවේ අත්තිවාරම දෙදරා යන දර්ශනයක් දුටු දිවැසිවරයා
   I. ආමෝස් ය.   II. යෙසායා ය.   III. ජෙරමියා ය.   IV. එසකියෙල් ය.

25. "හොඳ නරක අවබෝධ කිරීමේ ගසින් පමණක් නොකෑ යුතුය. නුඹ යම් දවසක ඒ ගසෙන් කන්නෙහි ද ඒ දවසෙහි මරණය නුඹට ඒකාන්තය " (උත්පත්ති 2 : 17)
මෙය,
I. දෙවියන් වහන්සේ ආදම්ට දුන් අවවාදය යි.
II. දෙවියන් වහන්සේ ඒවට දුන් අවවාදය යි.
III. දෙවියන් වහන්සේ ආදම්ට හා ඒවට දුන් අවවාදය යි.
IV. දෙවියන් වහන්සේ සර්පයාට දුන් අවවාදය යි.

26. මිසරයට මහඟු සේවයක් කළ ඊශ්‍රායෙල් ජාතිකයා වන්නේ,
I. රූබන්ය. II. ජුදාය. III. ජෝශප්ය. IV. බෙන්ජමින්ය.

27. අප ජීවිතය තුළ දෙවිඳුන්ට හිමි තැන ධනයටවත්, බලයටවත්, ලබා නොදිය යුතු බව අපට පෙන්වා දෙන්නේ, ජේසුස් වහන්සේ මුහුණ දුන්,
I. පළමු පරීක්ෂාවෙනි. II. දෙවන පරීක්ෂාවෙනි.
III. තෙවන පරීක්ෂාවෙනි. IV. සියළු පරීක්ෂා වලිනි.

28. පහත සඳහන් උපමාවන්ගෙන් දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ කියැවෙන උපමාවන්ට අදාළ අක්ෂර තෝරන්න.
A - වපුරන්නා පිළිබඳ උපමාව.
B - ලාසරස් හා අයකැමියා.
C - අබ ඇටය පිළිබඳ උපමාව.
D - දැළ පිළිබඳ උපමාව.
E - අකීකරු පුත්‍රයා පිළිබඳ උපමාව.

I. A C හා D. II. A B හා C. III. BC හා D. IV. CD හා E.

29. ප්‍රසාද ස්තාපනය තුළ "වරප්‍රසාදි ජීවිතය" සංකේතවත් කිරීමට යොදා ගන්නේ,
I. ජලය යි. II. සුදු වස්ත්‍රය යි. III. ක්‍රිෂ්මා තෛලය යි. IV.පාස්කු ඉටිපහන යි.

30. "වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න" යනුවෙන් ප්‍රකාශ කරන දිවැසිවරයා වන්නේ,
I. ජොවෙල් ය. II. අමෝස් ය. III. ජෝනා ය. IV. මීකා ය.

31. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය තුළින්,
I. පව්වලට සමාව ලැබේ. II. ඇතුළාන්ත සැනසීම ලැබේ.
III. නැවත පව් නොකිරීමට ශක්තිය ලැබේ. IV. ඉහත සඳහන් සියලු දේ ලැබේ.

32. "දරු සම්පත සමිඳාණන්ගෙන් ලැබෙන දායාදයකි. ඒ සම්පත එතුමාණන්ගෙන් ලැබෙන ඉමහත් ආශිර්වාදයකි" මෙසේ දැක්වෙන්නේ
I. හිතෝපදේශයෙහි ය. II. එපීස ලිපියෙහි ය. III. ගීතාවලියෙහි ය. IV. මතෙව් සුපුවතෙහි ය.

33. ප්‍රැන්ක් ඩෆ් මහතා විසින් ආරම්භ කරන ලද ගිහි ධර්මදූත සේවාව
I. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය යි. II. සාන්ත වින්සෙන් ද පාවුලා සමිතිය යි.
III. දේව මාතා දරු සමාගම යි. IV. මරිය හමුදාව යි.

34. අසීසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් තුමාගේ යැදුම වන්නේ,
I. ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනි ..... යැදුමයි.
II. ස්වාමීනි, මා ඔබගේ සාමයේ අවියක් කළමැනව .. .. යැදුමයි.
III. නමෝ මරියනි, ප්‍රියා ප්‍රසාද පූර්ණවන්තිනී .. .. .යැදුමයි.
IV. සාන්ත කුරුසේ අඩයාලමේ .. . .යැදුමයි.

35. ශාරීරික පුණ්‍ය ක්‍රියාවක් හා ආත්මීය පුණ්‍ය ක්‍රියාවක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න
I. අඥාණයන්ට ඉගැන්වීම, වහලුන් නිදහස් කිරීම.
II. මළවුන් වැළලීම, ජීවතුන් ද මළවුන් ද වෙනුවෙන් යාච්ඤා කිරීම.
III. වැරදි කමා කිරීම, දුකින් පෙළෙන්නන් සැනසීම.
IV. සාගිනි වූවන්ට ආහාර දීම, මළවුන් වැළලීම.


(4) WWW.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

36. ශුද්ධවූ සභාවේ ශික්ෂා පද,
I. තුනකි. II. හතරකි. III. පහකි. IV. හයකි.

37. දෙවි - මිනිස් සංවාදය සඳහා කිතු සමිඳුන් අපට ලබා දුන් පූර්වාදර්ශය
I. තුන් කාල ආරාධනාව ය. II. මංගල්‍ය ආරාධනාව ය. III. උදය ආරාධනාව ය. IV. ස්වාමිවාක් ආරාධනාව ය.

38. ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වූ අතර මරිය තුමිය
I. ස්වර්ගස්ත විය. II. ස්වර්ගාරෝපණය විය.
III. ස්වර්ගාටෙරෝපණය විය. IV. ඉහත සඳහන් සියල්ලම සිදු විය.

39. vi වන පාවුළු ශුද්ධෝත්තම පියතුමාගේ "මිස්ටෙරියුම් ෆීඩෙයි" යන විශ්ව ලේඛණය සිංහලෙන්
I. විස්වාසයේ අභිරහස ය. II. වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාවය.
III. ලෝක සාමය ය. IV. අයුක්තියට පිළිතුරය.

40. "ක්වායසිටම්"
I. පුද්ගල නාමය කි. II. යැදුමක නම කි. III. භාවනා ක්‍රමය කි. IV. වේද භේදය කි.

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගත් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

01. 1. පුරාණ ගිවිසුමේ පොත් බාණ්ඩ දෙකක් නම් කරන්න.
2. අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා උපන් රට හා අයත් නිකාය ලියා දක්වන්න.
3. දවන පූජා සඳහා යොදා ගන්නා පක්ෂීන් දෙවර්ගයක් සඳහන් කරන්න.
4. දේව ප්‍රේමයට විරුද්ධව පව් දෙකක් ලියන්න.
5. කිතුණු සභා බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
6. ඉශ්‍රායෙල් දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න.
7. ලූක් සුභාරංචිය ලියැවුනු කාලය හා ස්ථානය ලියා දක්වන්න.
8. ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
9. මැවීම පිළිබඳ දෙවන කතාවට අනුව මිනිසාට පවරන වගකීම් දෙක ලියන්න.
10. "රොසාරියුම්" යන වචනයේ තේරුම් දෙකක් ලියන්න.

02. i. ප්‍රඥා සාහිත්‍යයට අයත් පොත් දෙකක් නම් කරන්න.
ii. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද තුනක් නම් කරන්න.
iii. කිතුණු ඔබ ප්‍රඥාවන්තව කටයුතු කළ අවස්ථා පහක් කෙටියෙන් විස්තර කරන්න.

03. i. යාග පැවැත්වීමේ පරමාර්ථ දෙක ලියන්න.
ii. දවන පූජා වර්ග තුනක් සඳහන් කරන්න.
iii. කිතුණු ඔබේ ජීවිතය දෙවියන් වහන්සේට පිදෙන යාගයක් වීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් යෝජනා කරන්න.

04. i. ක්‍රි.ව. (1600) එක් දහස් හයසිය ගණන් වලදී මෙරටට පැමිණි ධර්මදූත කණ්ඩායම් දෙකක් නම් කරන්න.
ii. ශුධවූ ජුසේවාස් පියතුමා මෙරට සිදුකළ ප්‍රාතිහාර්යයන් තුනක් සඳහන් කරන්න.
iii. ශුදවූ ජුසේවාස් පියතුමාගෙන් ඔබේ ජීවිතයට ගත හැකි මග පෙන්වීම් පහක් විස්තර කරන්න.

05. i. මතෙව් සුභාරංචිය සඳහා භාවිතා වන වෙනත් නම් දෙකක් ලියන්න.
ii. මාර්ක් ලූක් ජොහන් යන සුභාරංචියක් හි සංකේත ලියා දක්වන්න.
iii. අපගේ ජීවිත සුභාරංචියක් කර ගනිමින් අන් අයව ප්‍රීතියට පත් කරන ආකාර පහක් විස්තර කරන්න.

06. i. ස්වාමිවාක් ආරාධනාව පිළිබඳව සඳහන් වන සුභාරංචි ග්‍රන්ථ දෙක නම් කරන්න.
ii. මරියතුමිය ශුද්ධවූ සභාවේ මාතාවක් බව ස්ථිරව තහවුරු කරන කරුණු තුනක් ලියන්න.
iii. යාච්ඤා කිරීමට පසු බට වන ඔබේ මිතුරෙකුට එහි අගය හා අවශ්‍යතාවය පෙන්වා දීම සඳහා ඉදිරිපත් කරන කරුණු පහක් ලියා දක්වන්න.

07. පහත සඳහන් මාතෘකා අතරෙන් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
i. පරිසරය සුරැකීම අපේ යුතුකමයි ii. ශුධවූ පේදුරු තුමා
iii. යාච්ඤාවෙන් සවිය ලබමු iv. ශුධවූ පාවුළු තුමා


PAST PAPERS WIKI
(4) WWW.PastPapers.WiKi (4)
Download Term Test Papers, Short Notes From One Place!

පිළිතුරු

| | | | |
|---|---|---|---|
| (1) II | (11) III | (21) IV | (31) IV |
| (2) I | (12) II | (22) II | (32) II |
| (3) I | (13) IV | (23) IV | (33) IV |
| (4) I | (14) III | (24) II | (34) II |
| (5) III | (15) IV | (25) III | (35) II |
| (6) I | (16) III | (26) III | (36) III |
| (7) III | (17) III | (27) II | (37) IV |
| (8) II | (18) I | (28) I | (38) III |
| (9) II | (19) III | (29) II | (39) I |
| (10) II | (20) I | (30) I | (40) IV |

01. 1. පංච පුස්තකය, ඉතිහාස පොත්, ප්‍රඥා සාහිත්‍යය, දිවැසිවර ග්‍රන්ථ, එළිදරව් සාහිත්‍ය (පිටුව 10 /1)
2. උපන් රට ආජන්ටිනාව, අයත් නිකාය - ජේසු නිකාය (පිටුව 10 /32)
3. කොබෙයියන්, පරවියන් (පිටුව 10/55)
4. දේව ආදරය පිළිබඳ මෙනෙහි නොකිරීම / දේව ප්‍රේමයට ප්‍රතිකාර නොදැක්වීම / දිව්‍යමය වූ යහපතින් කෙනෙකුව වළක්වා ලීම / උඩඟුවෙන් දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප කිරීම (පිටුව 10 /70)
5. පිළිගත් කිතුණු සභා, මූලධර්මවාදී සභා (පිටුව 10/123)
6. ලේඛක දිවැසිවරු, දේශක දිවැසිවරු (පිටුව 11/9)
7. කාලය ක්‍රි.ව. 80-85, ස්ථානය සිරියාවේ අන්තියෝගය (පිටුව 11 /14)
8. පූජකවරය හෙවත් පූජාත්වරය, ආශිර්වාදකාර බන්ධනය (පිටුව 11 / 73)
9. වගා කිරීම , රැක බලා ගැනීම (පිටුව 11/94)
10. රෝස මල් උයන / රෝස මල් දම (පිටුව 11 / 119)

02.i. ජොබ්, ගීතාවලිය, හිතෝපදේශය, ධර්මදේශකයා, ප්‍රේම ගී, ප්‍රඥාව, සිරාක් (පිටුව 10 /1)
ii. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව, රාජ්‍ය සහා ප්‍රඥාව, අභිධාර්මික ප්‍රඥාව, එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව (පිටුව 10 /16)
iii.
- විභාගයට පෙර යාච්ඥා කිරීම
- විශේෂ කටයුතු වලදී වෙලාවල් නොබැලීම
- යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වල පිහිට නොපැතීම
- නිතරම දේව කැමැත්ත සොයා කටයුතු කිරීම
- යාච්ඤාවේ බලය අවියක් කර ගැනීම වැනි කරුණු ලියා විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.

03. i. 1. පව්වලට වන්දි ගෙවීම සඳහා
2. දෙවියන් වහන්සේ සමග යහපත් අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා (පිටුව 10 / 55)
ii. සම්පූර්ණයෙන් දවන පූජා / සහභාගිකමේ පූජා / පාප පූජා / වන්දි ගෙවීමේ පූජා (පිටුව 10 /55)
iii. ◆ ජීවිත අභියෝග වලට එඩිතරව මුහුණ දීම ◆ තමන්ට පැමිණෙන දුක් වේදනා සතුටින් දරාගෙන දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම ◆ අපට පැවරෙන වගකීම්, යුතුකම්, නිසි ලෙස ඉටු කිරීමට වග බලා ගැනීම ◆ අප අතින් සිදු වී ඇති වැරදි පිළිගෙන මනස්ථාපයන් සිත් හැරීමට සිදු කිරීම ◆ අන් අයගේ දුක් වේදනා අසරණකම් දුබලතා හමුවේ ඔවුන්ට සංවේදී වීම (මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න)

04. i. 1602 ජේසු නිකායික ධර්මදූත කණ්ඩායම / 1605 - දොමිනිකාන නිකායික ධර්මදූත කණ්ඩායම / 1606 අගුස්තීනු නිකායික ධර්මදූත කණ්ඩායම (පිටුව 10 / 38)
ii. දැඩි නියගයක දී මහනුවර රාජධානියට වැස්ස ලබා දීම / දැදුරු ඔයෙන් පා ගමනින් එතෙර වීම / තනි අලියෙකු මෙල්ල කිරීම
iii. නොදන්නා ප්‍රදේශයන්හි නොදන්නා පුද්ගලයන්ට උදව් උපකාර කිරීම /අභියෝග පැමිණෙන විට එඩිතරව මුහුණ දීම / දේව සේවය සඳහා ඉමහත් / කැපවීමකින් යුතුව කටයුතු කිරීම / රෝගීන්ට ඇප උපස්ථාන කිරීමට නොපසුබට වීම / අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම (මෙවැනි කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න)

05. i. ශුධව් සභාවේ ශුභාරංචිය, දේව රාජයයේ ශුභාරංචිය (පිටුව 11 / 14)
ii. මාක් - සිංහයා
ලූක් - ගවයා
ජොහාන් - රාජාලියා (පිටුව 11 / 13)
iii. පවුලේ අය සමග සමගි සමාදානයෙන් යුතුව ජීවත් වීම
තමන්ට පැවරෙන වගකීම් යුතුකම් තමන්ට හැකි උපරිම මට්ටමෙන් ඉටු කිරීම
අන්‍යයන් සමඟ සුහදත්වයෙන් යුතුව ජීවත් වීම
අන්‍යයන්ගේ දුක - සැප සොයා බලා හැකි පමණින් උදව් උපකාර කිරීම
දෙමාපියන්ට, රෝගී වූවන්ට අසරණයන්ට රැක බලා ගැනීම
(මෙවැනි කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න.)

06.i. ලූක් සුබාරංචිය, මතෙව් සුබාරංචිය (පිටු 11/ 109)
ii. ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණය දක්වාම අපෝස්තුළුවරුන් හා ජනතාව සමඟ සිටීම
ඉන් පසුව ඔවුන්ව අතහැර පළා නොයෑම
සෑම දෙනා සමඟ එක්සිත්ව නොකඩවා යාච්ඤාවේ යෙදීම (පිටුව 11 / 120)
iii. ලියා ඇති කරුණු සැලකිල්ලට ගෙන ලකුණු ලබා

07.i. 11 ශ්‍රේණිය 18 පාඩම
ii. 11 ශ්‍රේණිය 22 පාඩම
iii. 10 ශ්‍රේණිය 9 පාඩම
iv. 10 ශ්‍රේණිය 8 පාඩම

PAST PAPERS WIKI


(1) www.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ඉතිහාසය
2013 - 2022
සංගීතය
2024
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න